www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ පාලක පක්ෂය යුද්ධය අවසන් කිරීමට ව්‍යාජ ව්‍යවස්ථාමය සැලසුමක් ඉදිරිපත් කරයි

## Sri Lankan ruling party issues phony constitutional plan for ending war

**විජේ ඩයස් විසිනි**

**2007 මැයි 10**

කොලඹ සභාග ආන්ඩුවේ ප්‍රධාන පක්ෂය වන ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) රටේ සිවිල් යුද්ධයට දේශපාලන විසඳුමක් සඳහා පදනම තහවුරු කරනු පිනිස අප්‍රේල් 30 දා ව්‍යවස්ථාමය යෝජනා මාලාවක් ප්‍රකාශයට පත් කලේ ය. කෙසේ වෙතත්, මෙම යෝජනා මාලාව, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය බොහෝ කලකට ඉහත දී ප්‍රතික්ෂේප කර ඇති පිලිවෙත් කරා ආපසු යාමකි. එනයින් ගත් කල, සාමය සඳහා සැලසුමක් වනවා වෙනුවට, එය ආන්ඩුවේ අඛන්ඩ මිලිටරි ආක්‍රමනය යුක්තියුක්ත කිරීමකි.

යෝජනා ඉදිරිපත් කෙරුනේ, ශ්‍රී ලංකාවේ "ජාතික ගැටලුව" -- එනම් 1983 දී යුද්ධය පිපිරීමට තුඩු දුන් රටේ දෙමල සුලුතරයට එරෙහිව සිදු කෙරෙන ක්‍රමානුකූල වෙනස්කම් කිරීම -- ලෙස හැඳින්වෙන ගැටලුව විසඳීම පිනිස අවශ්‍ය ව්‍යවස්ථාමය වෙනස්කම් පිලිබඳව සලකා බැලීමට ජනාධිපති මහින්ද රාජපක්ෂ විසින් පසු ගිය වසරේ දී පිහිටුවන ලද සර්ව-පාක්ෂික නියෝජිත කමිටුවක් (සපනික) සඳහා ය. රාජපක්ෂ එල්ටීටීඊ-හිතැති දෙමල ජාතික සන්ධානය එම කමිටුවට සම්බන්ධ කර නොගත් අතර ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ ජාතික හෙල උරුමය යන ප්‍රධාන සිංහල අන්තවාදී පක්ෂ දෙක කමිටුවට ඇතුලු කර ගත්තේ ය. එය ආන්ඩුවේ ප්‍රචාරක අභ්‍යාසයකට වඩා වැඩි දෙයක් නොවන බව එමගින් පෙන්නුම් කෙරුනි.

ව්‍යවස්ථාවේ පදනම ලෙස සිංහල-බෞද්ධ අධිපතිවාදය පවත්වා ගෙන යාම ආන්ඩුවේ අභිප්‍රාය බව ශ්‍රීලනිප ලියවිල්ල ආරම්භයේ දී ම පැහැදිලි කරයි. බුද්ධාගම රාජ්‍ය ආගම ලෙස තහවුරු කරන මූලික ව්‍යවස්ථා වගන්තිය එයට ඇතුලත් වේ. "ශ්‍රී ලංකා ජනරජය බුද්ධාගමට මූලික තැන දෙනු ඇති අතර ඒ අනුව බුද්ධ ශාසනය ආරක්ෂා කිරීම හා පෝෂනය කිරීම රාජ්‍යයේ වගකීම වනු ඇත." යැයි ලියවිල්ල සඳහන් කරයි. එම වගන්තිය රාජ්‍යය ආගමෙන් වෙන් කිරීම පිලිබඳ අති මූලික ප්‍රජාතන්ත්‍ර මූලධර්මය අමු අමුවේ උල්ලංඝනය කරන අතර සෙසු ආගම් දෙවන පන්තියේ තත්වයට ඇද හෙලයි.

2002 දී, එක්සත් ජාතික පක්ෂය (එජාප) නායකත්වය දෙන ආන්ඩුවක් එල්ටීටීඊය සමග සටන් විරාම ගිවිසුමක් අත්සන් කොට එය සමග සාම සාකච්ඡාවන්ට අවතීර්න විය. සාකච්ඡා සඳහා පදනම වූයේ, ඒකාබද්ධ කෙරුනු උතුරු-නැගෙනහිර පලාතක ආන්ඩුවක පාලනය එයට ලබා දෙන බලය බෙදා ගැනීමේ සැකැස්මකට හිලව් වසයෙන් දෙමල ඊලම් වෙනම රාජ්‍යයක් පිලිබඳ සිය දිගු කාලීන ඉල්ලීම අතහැර දැමීමට එල්ටීටීඊය කැමති වීම යි. එජාපය රට පාවා දෙන බවට ජවිපෙ හා ශ්‍රීලනිප කල හෙලා දැකීම් මධ්‍යයේ 2003 දී සාකච්ඡා බිඳ වැටුනි.

රාජපක්ෂ ජවිපෙ හා හෙල උරුමයේ පිටුබලය සහිතව 2005 නොවැම්බරයේ දී තුනී බහුතරයකින් ජනාධිපති තනතුරු දිනා ගෙන රට යලිත් යුද්ධය කරා තල්ලු කර තිබේ. 2002 සටන් විරාමය විවෘතව උල්ලංඝනය කරමින්, 2006 ජුලි සිට ආක්‍රමන මෙහෙයුම් මාලාවක් සඳහා ඔහු අන දී ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස දිවයිනේ නැගෙනහිර එල්ටීටීඊයට අයත්ව තිබූ භූමි ප්‍රදේශ බොහොමයක් මිලිටරිය විසින් අල්ලා ගනු ලැබ ඇත. තමන් සටන් විරාමයට හා ඊනියා ජාත්‍යන්තර සාම ක්‍රියාදාමයට බැඳී සිටින බවට රාජපක්ෂ තවමත් නරුම ලෙස කියා පාන නමුදු ශ්‍රීලනිප යෝජනා පෙන්නුම් කරන්නේ ආන්ඩුව ඒවාට යටින් පවත්නා දේශපාලන රාමුව මුලුමනින් ම ප්‍රතික්ෂේප කර ඇති බව යි.

බලය විමධ්‍යගත කිරීමේ කාරනයේ දී, ශ්‍රීලනිප ලියවිල්ල, දෙමල බහුතරයක් සහිත ප්‍රදේශ තුල ස්වයං-පාලනයකට ඉඩ දීමේ විධික්‍රමයක් ලෙස 1987 ඉන්දු-ලංකා ගිවිසුම යටතේ පිහිටුවන ලද වත්මන් පලාත් සභා ක්‍රමය පවා ඉරා දමයි. පලාත් සභා ක්‍රියාවට දමනු වස් 1987 අග දී සම්මත කෙරුනු 13 වන ව්‍යවස්ථා සංශෝධනය උතුරු හා නැගෙනහිර පලාත් දෙක තනි පරිපාලන ඒකකයක් -- එල්ටීටීඊය හා සෙසු දෙමල පක්ෂ විසින් කියාපානු ලබන ඊනියා දෙමල නිජබිම -- බවට ඒකාබද්ධ කිරීම ද සිදු කලේ ය.

සිංහල අන්තවාදියෝ එල්ටීටීඊයට දුන් ද්‍රෝහී සහනයක් ලෙස සඳහන් කරමින් එම පාලත් ඒකාබද්ධ කිරීමට හා

පලාත් මට්ටමේ බලය විමධ්‍යගත කිරීමට දෘඪතර ලෙස එරෙහි වූහ. තථ්‍ය වසයෙන් ගත් කල, 1988 දී පිහිටුවන ලද උතුරු-නැගෙනහිර පලාත් සභාව මාස කිහිපයකට පසුව ජනාධිපති ආඥාවක් මගින් හිතුවක්කාරී ලෙස විසුරුවා හරින ලද අතර එය කිසිදාක යලි කැඳවූයේ නැත. රාජපක්ෂ බලයට පැමිනීමෙන් පසුව, ජවිපෙ විසින් ඉදිරිපත් කරන ලද පෙත්සමක් මත, ශ්‍රේෂ්ඨාධිකරනය උතුරු හා නැගෙනහිර පලාත් ඒකාබද්ධ කිරීම අහෝසි කරමින් සැක කටයුතු නියෝගයක් නිකුත් කලේ ය.

පලාත් සභා අහෝසි කොට දිස්ත්‍රික්කවලට -- එනම් වඩා කුඩා හා එනයින් අඩු ආනුභාවයෙන් යුක්ත ඒකකයකට -- බලය විමධ්‍යගත කිරීමට පක්ෂ වීම මගින් ශ්‍රීලනිප යෝජනා සිංහල අන්තවාදීන්ගේ ආස්ථානය වැලඳ ගෙන තිබේ. වර්තමානයේ දී පලාත් නවයට සංසන්දනාත්මකව ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක 25ක් තිබේ. ලියවිල්ල යෝජනා කරන්නේ දිස්ත්‍රික්ක සංඛ්‍යාව 30 දක්වා ඉහල දැමීමට යි, එනම් බලය විමධ්‍යගත කරන ඒකක ඊටත් වඩා කුඩා කිරීමට යි. මෙම සැලසුමේ එල්ලය වන්නේ රටේ සුලුතරයන්ට එරෙහි වෙනස්කම් කිරීම්වලට විසඳුමක් සැපයීම නොව පාලක පක්ෂයේ දේශපාලන අනුග්‍රහය ඉහල දමා ගැනීම යි.

"ජාතික ප්‍රශ්නය" විසඳලීමේ විධික්‍රමයක් ලෙස 1981 දී දිස්ත්‍රික් සභා ප්‍රථම වරට පිහිටුවන ලද්දේ ජනාධිපති ජේ.ආර්. ජයවර්ධනගේ එජාප ආන්ඩුව යි. එම යෝජනාව දෙමල පක්ෂ මෙන් ම වමේ පක්ෂ විසින් ද මුලුමනින් ම ප්‍රතික්ෂේප කරන ලදි. දිස්ත්‍රික් සභා මැතිවරන තරඟ කිරීමට එකඟ වූයේ ජවිපෙ පමනි. එම තත්වයට ප්‍රතිචාර වසයෙන්, ජයවර්ධන දෙමල ජනයා ත්‍රස්ත කොට උතුරේ දිස්ත්‍රික් සභා බලාත්කාරයෙන් පටවනු පිනිස යාපනයට ස්වෝත්තමවාදී මැරයන්ගෙන් පිරුනු දුම්රියක් යැවී ය. එම ව්‍යාපාරය තුල දී, මෙම මැරයෝ දෙමල ග්‍රන්ථවල හා ඒවායේ අත්පිටපත්වල වටිනා එකතුවක් අන්තර්ගතව තිබූ කීර්තිමත් යාපන පුස්තකාලය ගිනි තබා වාර්ගික ආතතීන් තව දුරටත් අවුලුවාලී ය.

පලාත් සභා අහෝසි කොට කුප්‍රකට දිස්ත්‍රික් සභා කරා පල්ලම් බැසීමේ ශ්‍රීලනිප යෝජනා එනයින් ගත් කල ගනන් බලා සිදු කෙරෙන ප්‍රකෝපකරනයකි. එපමනක් නොව, මොන යම් හෝ අව්‍යාජ බලය බෙදා හැරීමක් බොහෝ සෙයින් මිථ්‍යාවකි. ඉහල පරිපාලන තනතුර වන දිස්ත්‍රික් මහ ඇමති ප්‍රාදේශීයව ඡන්දයෙන් තෝරා පත් කර නොගන්නා අතර ඒ සඳහා පත් කෙරෙන්නේ කොලඹ සිටින ජනාධිපති විසින් නම් කෙරෙන තැනැත්තෙකි. ශ්‍රීලනිප යෝජනාවලට අනුව, එම තත්වය යටතේ පවා, "දිස්ත්‍රික්කයේ පරිපාලනය අසාර්ථක වී ඇති බවට ඔහු සෑහීමකට පත් වේ නම්", මැදිහත් වී ඍජු පාලනය පවරා ගැනීමේ හැකියාව ජනාධිපතිට හැම විට ම තිබේ.

අතීතයේ දී කටුක ජන වාර්ගික මතභේද අවුලුවා ලූ ඉඩම් පිලිබඳ කේන්ද්‍රීය ප්‍රශ්නය සම්බන්ධයෙන් දිස්ත්‍රික් සභාවලට කිසිදු බලයක් නැත. මධ්‍යම ආන්ඩුව විසින් පත් කරනු ලබන විශ්‍රාම ලත් ජ්‍යෙෂ්ඨ විනිසුරුවරයන්ගෙන් සමන්විත වීමට ඉඩ ඇති "ඉඩම් හා ජලය පිලිබඳ නිත්‍ය කොමිසමක්" ව්‍යවස්ථාව මගින් පිහිටුවීමට ශ්‍රීලනිප යෝජනා කරයි. වෙනත් වචනවලින් කිය තොත්, ඉඩම් හා ජලය බෙදා හැරීම ගැන තීන්දු කිරීමේ බලය දෘඪතර ලෙස කොලඹ ම රැඳෙනු ඇත.

ප්‍රාදේශීය සුලුතරයන්ගේ දුක් ගැනවිලි විමසා බැලීමට දිස්ත්‍රික් ජන වාර්ගික ඔම්බඩ්ස්මන්වරුන් පත් කිරීමට ද ශ්‍රීලනිප යෝජනා කරයි. එහෙත් මෙම යාන්ත්‍රනය ද ජනාධිපතිගේ පාලනය යටතේ පවතී. පත් කිරීම් කෙරෙනු ඇත්තේ "ජනාධිපතිගේ අදහස් විමසමින් අධිකරන ඇමති" විසිනි. තව දුරටත් කිය තොත්, ඔම්බඩ්ස්මන්වරයකුගේ බලතල "පැමිනිලි . . . (ගැන) විමසා බැලීමට හා" යම් විසඳුමක් සඳහා වූ "නිර්දේශ . . . අදාල බලධාරින්ට නිකුත් කිරීමට" පමනක් දැඩි ලෙස සීමා වනු ඇත.

## ප්‍රජාතන්ත්‍ර විරෝධී සැලසුම්

ශ්‍රීලනිප ව්‍යාවස්ථාමය සැලසුම්වල ඉතිරි කොටස එම ආඥාදායක දිශාවට ම ගමන් කරයි. සමාලෝචනය කිරීමේ ඉහල මන්ත්‍රී මන්ඩලයක් ලෙස විශාල වසයෙන් ඡන්දයෙන් තෝරා පත් කර නොගැනෙන සෙනෙට් සභාවක් යලි පිහිටුවීමට එය යෝජනා කරයි. 1972 දී අහෝසි කරන ලද මෙම ආයතනය 1947 දී බ්‍රිතාන්‍ය පාලකයන් විසින් සකසන ලද ශ්‍රී ලංකාවේ ප්‍රථම ව්‍යවස්ථාව තුල හඳුන්වා දෙන ලද්දේ, ඔවුන්ගේ ද නිදහසෙන් පසුව දේශීය ප්‍රභූවේ ද අවශ්‍යතා ආරක්ෂා කර ගැනීමේ විධික්‍රමයක් ලෙස ය. දැන් එයට යලි පන දෙන්නේ ඊට සමාන දේශපාලන අරමුනු වෙනුවෙනි.

ශ්‍රීලනිප යෝජනා යටතේ, සෙනෙට් සභාව සාමාජිකයන් 75කගෙන් සමන්විත වනු ඇතඃ එයින් 20ක් ජනාධිපති විසින් ඍජුව ම පත් කෙරෙන අතර තවත් 30ක් දිස්ත්‍රික් මහ ඇමතිවරුන් ය. ඔවුහු ද ජනාධිපති විසින් නම් කෙරෙන පුද්ගලයෝ ය. ඉතිරි 25 දෙනා මහ මැතිවරනයේ දී ඔවුන් ලද ඡන්ද ප්‍රමානවලට සමානුපාතිකව දේශපාලන පක්ෂ විසින් නම් කෙරෙනු ඇත. ජනාධිපති අත තවත් වඩා බලතල තැබීමේ මෙම පියවර තොරොම්බල කෙරෙන්නේ "මධ්‍යම ආන්ඩුවේ බලය බෙදීමේ" හා "සුලුතරයන්ට හා සුලුතර පක්ෂවලට ප්‍රමානවත් නියෝජනයක්" ලබා දීමේ නාමයෙනි.

ශ්‍රීලනිප සැලසුම ප්‍රජාතන්ත්‍රවාදී ඉරියව්වක් පාන ස්ථානයේ පවා, එයට යටින් පවත්නා අන්තර්ගතය ප්‍රජාතන්ත්‍ර විරෝධී ය. විධායක ජනාධිපති ක්‍රමය අවසන් කොට "අගමැතිවරයකුගේ නායකත්වයෙන් යුක්ත කැබිනට් මන්ඩල ක්‍රමයක්" සහිත "පාර්ලිමේන්තු ක්‍රමයේ

ආන්ඩුවකට” ආපසු යාමට ලියවිල්ල යෝජනා කරයි. ප්‍රජාතන්ත්‍ර අයිතීන් උල්ලංඝනය කිරීම සමග දිගු කලක් බැඳී පැවත ඇති බලගතු විධායක ජනාධිපති ක්‍රමය පුලුල් පරිමානයෙන් මහජන වෛරයට ලක්ව ඇත. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමේ යෝජනාව ක්‍රියාවට දැමීමට නම්, කෙසේ වෙතත්, “ජාතික ඒකමතික භාවයක්” අවශ්‍ය යැයි ශ්‍රීලනිපය අවධාරනය කරයි. එය වනාහි එකඟතාවක් ඇති කර ගැනීමට නොහැකි වුව හොත් එම යෝජනාව අතහැර දැමීම සඳහා කදිම සමාවට කාරනාවක් වනු ඇත. “එවන් ඒකමතික භාවයක් නොමැති තත්වයක දී, සුදුසු සංශෝධන සහිතව විධායක ජනාධිපති ක්‍රමය දිගට ම පවතිනු ඇත.” යැයි ශ්‍රීලනිප සැලසුම ප්‍රකාශ කරයි.

සමස්ත සැලසුම ම සකසනු ලැබ ඇත්තේ, එය ඇති තරම් දුර ගොස් නැතැයි වහාම විවේචන එල්ල කොට ඇති සිංහල අන්තවාදී පක්ෂවල සහයෝගය දෙස ඇස් දල්වා ගෙන ය. බොහෝ සෙයින් ජවිපෙ විසින් ම සකසන ලද රාජපක්ෂගේ 2005 ජනාධිපතිවරන ප්‍රකාශනය වන මහින්ද චින්තනය ඔහු විසින් පාවා දෙනු ලැබ ඇතැයි ජවිපෙ චෝදනා කර තිබේ. “ඒකීය රාජ්‍යය” ආරක්ෂා කිරීමෙන් ආන්ඩුව පසු බැස ඇතැයි එය විවේචනය කර ඇති ජවිපෙ, “සන්නද්ධ හමුදාවන් උතුර හා නැගෙනහිර ත්‍රස්තවාදී කොටින්ගේ ග්‍රහනයෙන් මුදා ගෙන මව්බිම ආරක්ෂා කර ගැනීමට වීරෝදාර යුද්ධයක් ගෙන යමින්” සිටින අවස්ථාවේ බලය බෙදා හැරීමේ සියලු සැලසුම් පසෙක තබන ලෙස ද ඉල්ලා සිටියේ ය. බෞද්ධ සංස්ථාපිතය සඳහා තව දුරටත් ව්‍යවස්ථාමය සහනයන් දෙන ලෙස හෙල උරුමය ඉල්ලා සිටී. ශ්‍රීලනිප යෝජනා දැන් යලි සලකා බැලෙනු ඇතැයි ප්‍රකාශ කිරීම මගින් රාජපක්ෂ මෙම විවේචනවලට දැනට මත් ප්‍රතිචාර දක්වා ඇත.

ශ්‍රීලනිප යෝජනා සාකච්ඡාමය සාමයක් සඳහා බැරෑරුම් යෝජනා බවට කියා පෑම විකාරයකි. දිස්ත්‍රික් සභා පිහිටුවීමට හිලව් වසයෙන්, “රාජ්‍ය හමුදා හැර දිස්ත්‍රික්කය තුල සිටින අන් ඕනෑම කන්ඩායමක් අත පවත්නා අවි භාර දීමේ සමාන්තර ක්‍රියාදාමයක් සිදු විය යුතු” යැයි ශ්‍රීලනිප යෝජනා ප්‍රකාශ කරයි. එල්ටීටීඊය මෙම කොන්දේසි යටතේ සිය අවි භාර දෙයි නම්, වෙනම දෙමල රාජ්‍ය කැබැලිත්තක් පිලිබඳ සිය ඉල්ලීම අතහැර දැමීම පමනක් නොව, මීට පෙර පැවති සියලු ම “සාම සැලසුම්” සම්මුති ප්‍රතික්ෂේප කරන පරිපාලන සැලසුමක් පිලිගැනීමක් ද එයින් අදහස් කෙරෙනු ඇත.

එලෙස ගත් කල, ශ්‍රීලනිප ලියවිල්ල එයට සුදුසු ආකාරයෙන් නම් කල යුතු යඃ එනම් වර්ගවාදී යුද්ධය සඳහා දේශපාලන වේදිකාවකි.